**කොළඹ විශ්වවිද්‍යාලය - 2016**

**--------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනිව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේ දී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීයයේ පීඨාධිපති ඇතුළු කථිකාචාර්යවරුන් 09 දෙනෙකු මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරන බැවින් විශ්වවිද්‍යාලයේ පූර්ණ පාලන බලය සහිතව පවතින පරිපාලිත සමාගමක් බව පැහැදිලි වේ. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමග සීමිත කලම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකඟතා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු.191,839 ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වූ රු.35,296,230,000 ක් වටිනා ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පු සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ලබාගෙන නොතිබූ අතර පවරා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින බව උපකුලපතිවරයා විසින් 2017 අගෝස්තු 17 දින මා වෙත වාර්තා කර තිබුණි.

## 2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ණය ශේෂයන්ගෙන් එකතුව රු.782,831 ක ණය ශේෂ 12 ක් වර්ෂ 03 සිට වර්ෂ 18 ත් අතර කාලයක් ගතවී තිබුණද ඒවා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) වෛද්‍ය පීඨයේ සේවකයින් 04 දෙනෙකු විසින් ලබාගත් ණය පියවීමකින් තොරව සේවයෙන් ඉවත්වී තිබූ අතර 2016 දෙසැම්බර් 31 දක්වා රු.288,399 ක ණය ශේෂයක් ඔවුන්ගෙන් අයවීමට තිබුණි. මෙම ණය මුදල් අදාල පුද්ගලයින්ට ලබාදී වර්ෂ 5 ත් වර්ෂ 9 ත් අතර කාලයක් ගතවී තිබුණද එම මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 30 දෙනෙකු විසින් ගිවිසුම් කඩකිරීම හේතුවෙන් රු.40,086,005 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. මින් ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.8,121,094 ක ශේෂය වර්ෂ 11 සිට වර්ෂ 38 දක්වා කාල පරාසයක් ගතවී තිබුණ ද කිසිදු මුදලක් අයකර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත II කොටස 15(V) වගන්තිය | යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පැවැත්විය යුතු පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක් විසින් පාඨමාලා 53 ක් පවත්වා තිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| | (i) XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියළුම නිළධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිළධාරීන් 743 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කර නොගෙන වැටුප් හා දීමනා ලෙස රු. 1,375,562,712 ක් ගෙවා තිබුණි. |
| | (ii) XXII වැනි පරිච්ඡේදයේ 18- 3 වගන්තිය | යම් තැනැත්තෙකුගේ වැඩ තහනම් කර තිබේ නම් ඔහුට විරුද්ධව පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කළ යුතුය. කොළඹ විශ්වවිද්‍යාලයේ කම්කරු සේවයේ නියුතුව සිටි පුද්ගලයෙක් 2005 දෙසැම්බර් 09 වන දින සිට අඩ වැටුප් සහිතව වැඩ තහනමකට ලක්ව ඇති අතර 2017 ජුනි මස 30 දින දක්වා වර්ෂ 11 යි මාස 06 ක් සඳහා අඩ වැටුප් ලෙස රු.1,885,809 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද අදාළ විනය පරීක්ෂණ කටයුතු අවසන්ව නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------------------------------<br>මුදල් රෙගුලාසි අංක 371 හා 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) ලබාගත් අත්තිකාරම් මුදලින් අදාල කාර්යය කඩිනමින් නිමකොට අත්තිකාරම් පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 28 ක දී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.2,772,704 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 47 සිට දින 326 ක් දක්වා කාලයක් ගතවී තිබුණි.<br><br>(ii) වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවත් ආයතනය විසින් රු.149,940 ක සිට රු.658,103 ක් දක්වා පරාසයක් තුළ සමාලෝචිත වර්ෂයේ අවස්ථා 07 කදී අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඈ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004 පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | වාර්ෂිකව පුස්තකාල පොත් සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.380,885,509 ක පුස්තකාල පොත් සහ වාර සඟරා සම්බන්ධයෙන් 2016 වර්ෂයේ වාර්ෂික පොත් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ප්‍රවාහන පහසුකම් හිමි තනතුරකට අයත් නොවන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු (ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක) වෙනුවෙන් 2015 වර්ෂයේ සිට වාහනයක් සහ මාසික ඉන්ධන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් ඉන්ධන වටිනාකම රු.337,720 ක් විය. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---------------------------------------------------------

අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක තනතුර සඳහා 2015 සැප්තැම්බර් 9 වන දින පැවති 499 වන පාලක සභා රැස්වීමේදී ගත් තීරණයක් ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන අරමුදලින් රු.1,050,000 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.176,157,091 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.326,038,151 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.149,881,060 කින් පිරිහී තිබුණි. රජයේ ප්‍රදාන රු. 338,034,192 කින් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු.444,958,302 කින් හා අනෙකුත් පොදු කාර්ය වියදම් රු. 343,767,748 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තය උච්චාවචනයන් සහිතව වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂය වන විට රු.2,968,791,856 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් තොරතුරු අනුව විශ්වවිද්‍යාලයේ අරමුණු වනුයේ ඉගැන්වීම් කටයුතු සඳහා නවීනතම තාක්ෂණය භාවිතය, අධ්‍යාපන පාඨමාලාවල තත්ත්වය ජාත්‍යන්තර මට්ටම දක්වා ඉහළ නැංවීම, ඉහළ පර්යේෂණ මට්ටමක් ඇති කිරීම සඳහා පහසුකම් පුළුල් කිරීම, විශ්වවිද්‍යාලයේ සමාජයීය වටපිටාව ඉහළ නැංවීම, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල දක්ෂතාවන් ශක්තිමත් කිරීම, කළමනාකරණ පද්ධති ඉහළ නැංවීම සහ සමාජයීය යහපත තකා දැනුම හා පළපුරුද්ද යොදාගැනීම වේ.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් සංයුක්ත සැලැස්මෙහි ප්‍රධාන කාර්යසාධන නිර්ණායක ලෙස දක්වා තිබූ නිර්ණායක 06 ක් කෙරෙහි විගණනයේදී අවධානය යොමු වූ අතර එම කරුණු වන කර්මාන්ත සහයෝගීතාවය සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම, ප්‍රසිද්ධ සමුළු පැවැත්වීම, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පොත් ප්‍රසිද්ධ කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය හුවමාරු වැඩසටහන් යටතේ විදේශ සංචාරවල නිරතවීම, පශ්චාත් උපාධි ශිෂ්‍යයන් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ ජාත්‍යන්තර තරඟ සඳහා ශිෂ්‍යයින් ඉදිරිපත් කිරීම යන නිර්ණායකයන්හි ප්‍රගතිය සියයට 8 සිට සියයට 50 දක්වා අතර පරාසයක අඩු අගයක් වූ අතර එම නිර්ණායකයන් යටතේ කාර්යසාධන ප්‍රගතිය වර්ධනය කරගැනීම කෙරෙහි තවදුරටත් අවධානය යොමු විය යුතුව තිබුණි.

(ආ) ලෝක ශ්‍රේණිගත කිරීම් අතර 2015 වර්ෂයේදී 2034 ස්ථානයේ සිටි කොළඹ විශ්වවිද්‍යාලය 2016 වන විට 2171 ස්ථානය දක්වා පසුබෑමක් නිරීක්ෂණය විය.

(ඇ) 2014, 2015 හා 2016 වර්ෂවල විද්‍යා පීඨය සහ වෛද්‍ය පීඨය සඳහා බඳවාගැනීමට හැකිව තිබූ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 2015 දෙනෙක් වුවද බඳවාගෙන තිබුණේ ශිෂ්‍යයන් 1793 දෙනෙක් පමණක් වීම හේතුවෙන් ශිෂ්‍යයන් 222 දෙනෙකුට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථා අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) 2014, 2015 හා 2016 වර්ෂ සඳහා කලා පීඨයට බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 550 දෙනෙකු ලෙස දක්වා තිබුණ ද එම වර්ෂ තුනෙහිදීම පිළිවෙලින් 596 දෙනෙකු, 739 දෙනෙකු හා 692 දෙනෙකු බඳවාගෙන තිබීමෙන් වර්ෂ 03 සඳහා බඳවාගත් අතිරික්ත ශිෂ්‍ය සංඛ්‍යාව එකතුව 377 දෙනෙකු විය. විශ්වවිද්‍යාලයට බඳවාගැනීමට හැකි ශිෂ්‍ය සංඛ්‍යාව වසර ගණනාවකට පෙර තීරණය කර තිබූ අතර එම සංඛ්‍යාව කාලීනව සංශෝධනය කිරීමට කළමනාකාරිත්වය අවධානය යොමු කර නොතිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භෞතික පොත් පරීක්ෂාවට අනුව රු.3,292,524 ක් වටිනා පොත් 27,367 ක් අස්ථාන ගත වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී පොත් 3,298 ක වටිනාකම වූ රු.499,628 ක් ගිණුම්වලින් ලියාහැරීම හැර ඒ සම්බන්ධයෙන් වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය වෙත ලබාදුන් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.140,910,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වී තිබුණු අතර ඒ තුළ ඇතුළත් රු.107,590,000 ක් ඉකුත් වර්ෂ ගණනාවක සිට අදාළ අරමුණු සඳහා වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---

නිසි ලෙස පුරෝකථනය කළ වැය ඇස්තමේන්තුවකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.297,750 ක වියදම් සඳහා අවස්ථා 41 ක දී රු.761,350 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාලය සතුව 2016 දෙසැම්බර් 31 දිනට පැවති අරමුදල් ගිණුම් 29 කට අදාළ එකතුව රු. 23,863,768 ක් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල තොග සමීක්ෂණ වාර්තාව අනුව ගබඩාව තුළ චලනය නොවන තොග හා සෙමින් චලනය වන තොග පිළිවෙලින් රු.165,518 ක් හා රු.259,760 ක් විය.

(ඇ) පුස්තකාලයෙන් පොත් වංචනික අයුරින් බැහැරගෙන යාම වැළැක්වීම සඳහා පුස්තකාල දොරටුව අසල සවිකර තිබෙන ආරක්ෂිත විද්‍යුත් ගේට්ටුව 2016 පෙබරවාරි 08 දින සිට විගණිත දිනය වූ 2017 මැයි 09 දින දක්වා වර්ෂයකට අධික කාලයක් අක්‍රීය වී තිබුණද එය අළුත්වැඩියා කර නොතිබුණි.

**4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන පොත්හල, බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බදුකරුවෙකු තෝරාගෙන තිබුණි. පොත්හල පවත්වාගෙන යන වර්ග අඩි 685 ක ගොඩනැගිල්ලෙහි තක්සේරු කුලිය නොසළකා 2008 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා කාලය තුළ එකම ආයතනයක් වෙත බදු දී තිබීම නිසා රු.966,668 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද එම පරිශ්‍රය තුළ පිහිටි බැංකුවක් සහ කිරිහල් දෙකක් වෙනුවෙන් කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි.

(ආ) 2016 මාර්තු 15 දින සිට 2018 මාර්තු 14 දින දක්වා කාලය වෙනුවෙන් විශ්වවිද්‍යාලවල ආරක්ෂක සේවාව සැපයීම සඳහා ලංසු කැඳවීම වෙනුවෙන් පිළියෙල කර තිබුණු පිරිවිතරයන්හි විශ්වවිද්‍යාලවල ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක පළපුරුද්ද සපුරා තිබිය යුතු බවට ඇතුළත් කර තිබුණු කොන්දේසිය හේතුවෙන් ඉදිරිපත්ව තිබුණු ලංසු අතරින් ලංසු 03 ක් ප්‍රතික්ෂේප වී තිබුණි. ඒ තුල ඇතුළත් දෙවන අවම මිල ගණන වූ රු.41,288,400 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුව ප්‍රතික්ෂේප වී තිබීම හේතුවෙන් පස්වන අවම මිල ගණන වූ රු.44,454,896 කට ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනයට ප්‍රසම්පාදනය පිරිනැමීමට සිදු වී තිබුණි. ඒ අනුව එක් වර්ෂයක් සඳහා රු.3,666,496 ක් බැගින් 2016 මාර්තු සිට 2018 මාර්තු මාසය දක්වා රු.7,332,992 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මහල් 05 කින් යුත් සුජාතා ජයවර්ධන කාන්තා නේවාසිකාගාරයේ වැසිකිළි 50 ක් හා නාන කාමර 30 ක් නවීකරණය කිරීම සඳහා රු.25,359,367 ක (වැට් සහිත) මුදලකට පුද්ගලික සමාගමක් සමඟ 2013 දෙසැම්බර් 24 දින ගිවිසුමට එළඹ තිබුණි. වැඩ ප්‍රමාද කිරීමේ හේතුවෙන් 2015 ජුනි 16 දින විශ්වවිද්‍යාලය විසින් අදාල කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කළ බව කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය පරිදි ලබාගෙන ඇති රු.1,132,114 ක් වටිනා කාර්යසාධන ඇපකරය, කල් ඉකුත්වීමට පෙර විශ්වවිද්‍යාලය වෙත අයකරගත යුතුව තිබුණද එය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

ඉහත කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීමෙන් අනතුරුව රු.11,197,072 ක්වූ ඉතිරි වැඩ නිමකරගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම වෙනුවට, 2015 වර්ෂයේ ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකු වෙත මහල් 5 හි ඉතිරි ඉදිකිරීම් වැඩ වෙන වෙනම පවරා තිබුණි.

(ඈ) සුජාතා ජයවර්ධන නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිල්ල, හැව්ලොක් නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිලි, බ්ලොට් ෆෝමේන් නේවාසිකාරයේ ඉදිරිපස ගොඩනැගිල්ලේ පහළ මාලය සහ පිටුපස මැද ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය නිසිපරිදි යොමුවී නොතිබූ බැවින් මෙම නේවාසිකාගාර භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතියද එහි සිසුන් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 325ක් පැවතුණි. ආචාර්යවරුන්ගේ පුරප්පාඩු 111 ක් පැවතීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු 379 දෙනෙකුගේ සේවය ලබාගැනීම වෙනුවෙන් රු.29,406,870 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) කාලීනව වැදගත් නොවන යතුරු ලේඛක තනතුරු 05 ක් සහ ලඝු ලේඛක තනතුරු 17 ක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු වෙනුවට කාලීනව වැදගත් වන තනතුරු ඇතිකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ වැය විෂයයන් 20 ක අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | දේපළ අයිතිය තහවුරු කර නොගැනීම, වත්කම් නඩත්තු කිරීම හා අපහරණය පිළිබඳ දුර්වලතා පැවතීම. |
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. |
| (ඇ) | අරමුදල් පවත්වාගෙන යාම | අරමුදල් පිහිටවූ නිශ්චිත කාර්යයන් සඳහා නොයෙදවීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | අදාල ලිපිගොනු විධිමත්ව නඩත්තු නොකිරීම සහ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම. |
| (ඉ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම සටහන් නොකිරීම. |
| (ඊ) | පුස්තකාල පරිපාලනය | විධිමත් පරිදි පුස්තකාල පොත් සමීක්ෂණ නොපැවැත්වීම, සංසන්දනාත්මක ලේඛන විධිමත්ව පවත්වාගෙන නොයාම. |
| (උ) | මෙහෙයුම් පාලනය | ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු කරගෙන යාමට සුදුසු පරිසරයක් පවතින ආකාරයට නේවාසිකාගාර පවත්වාගෙන නොයාම. |